**අකුරැස්ස ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ සභාව සතු දේපළ සංවර්ධනය කිරීම සඳහා දරන ලද රු.3,876,316 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ ණයහිමි ශේෂය රු.1,091,779 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | ගෙවිය යුතු රු.381,356 ක වියදම් ප්‍රාග්ධන ණයහිමියන් යටතේ මෙන්ම විවිධ ණයහිමියන් යටතේද ගිණුම්ගත කිරීම නිසා විවිධ ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් වැඩිපුර ගිණුම්ගත වී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු. 5,535,032 ක් සඳහා විවිධ ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ශේෂය සකස්ව ඇති ආකාරය පිළිබඳ විස්තර ලද පසු ණයහිමි ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව උසාවි දඩ බිල් කිරීම් රු.88,896 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 05 ක් වෙනුවෙන් අය විය යුතු රු.93,600 ක් ගිණුම්ගත කර නොතිබුණි. | බලපත්‍ර ලබා නොගත් දැන්වීම පුවරු සඳහා නඩු පවරා ඇති බවත්, අධිකරණය විසින් නියම කරන දඩ මුදල නිශ්චිත කළ නොහැකි බැවින් ගිණුම් ගත කර නොමැති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.4,234,450 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ පුස්තකාල පොත් වටිනාකම රු.593,968 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.81,814 ක් වූ විවිධ වියදම් සඳහා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඒ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.773,474 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 37 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.5,563,364 ක් වූ පොදු ගබඩා තොග ශේෂය හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.2,810,253 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරන බව | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | වර්ෂ 02 ඉකුත් වූ එකතුව රු.103,313 ක තැන්පතු ශේෂ 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මාස 06 ඉකුත් වූ තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කරනමෙන් අංශ ප්‍රධානීන් වෙත දන්වා ඇති බවත්, තැන්පතුකරුවන් ඉල්ලීමක් කළ පසු ගෙවීමට යටත්ව එම තැන්පතු සභා ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.925,273 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 17,133,372 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,451,000 | 2,425,027 | 2,235,903 | 2,141,195 | 7,092,000 | 2,252,707 | 1,870,609 | 1,952,071 |
| (ii) | කුලී | 6,850,000 | 5,488,380 | 7,603,326 | 6,796,224 | 5,900,000 | 5,521,233 | 4,118,954 | 8,911,170 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,309,250 | 1,997,218 | 1,997,218 | - | 1,993,500 | 1,805,867 | 1,805,867 | - |
| (iv) | වෙනත් ආදායම් | 17,729,000 | 12,738,988 | 11,925,397 | 1,072,321 | 19,103,500 | 10,047,760 | 9,789,030 | 258,730 |
| | | 34,339,250 | 22,649,613 | 23,761,844 | 10,009,740 | 34,089,000 | 19,627,567 | 17,584,460 | 11,121,971 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | සභාවේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 1,853,144 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉන් වරිපනම් ඒකක 790 කට අදාළව අය විය යුතුව තිබූ ශේෂය රු. 1,336,829 ක් විය. | හිඟය අය කරගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සභාව සතු කඩ කාමර 266 න් 230 ක් බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් බදුකරුවන් 166 දෙනෙකුගෙන් රු.6,215,246 ක කඩ කුලී අයවීමට තිබුණි. ඉන් බදුකරුවන් 67 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ රු.4,975,612 ක ශේෂවල හිඟ කාලසීමාව වසර 03 ක් ඉක්මවා තිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | අකුරැස්ස ප්‍රාදේශීය සභාවට අයත් වෙළෙඳ සංකීර්ණ 02 ක පිහිටි කඩ කාමර 42 ක් ලිඛිත ගිවිසුමකින් තොරව බදු දී තිබුණි. | ගිවිසුම් ගත විය හැකි කඩ කාමර සඳහා ගිවිසුම්ගතවීමටත්, අනෙකුත් කඩ කාමරවල බදු අයිතිය පැවරීමෙන් පසුව ගිවිසුම්ගතවීමටත් කටයුතු කරනු ලබන බව. | කඩ කාමර කුලියට දීමේදී ගිවිසුම්වලට එළඹිය යුතු වේ. |
| (ඈ) | අකුරැස්ස ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළෙඳපොල වෙළෙඳ සංකීර්ණයට අයත් කඩ කාමර 23 කට අදාළව අය කළ යුතු එක්වන් මුදල වූ රු.1,905,734 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. | බදුකරුවන් සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු.1,479,052 හා මුද්දර ගාස්තු රු.40,961,620 ක් අය විය යුතුව තිබුණි. | දකුණු පළාත් ආණ්ඩුකාරවරයා වෙතින් අදාළ මුදල් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඊ) | අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා ආපනශාලා 03 ක් සම්බන්ධයෙන් සමීක්ෂණය සිදු කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ගාස්තු අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර ලබා දීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (viii) උප වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයට අයත් නාගරික නොවන සීමාව තුල සිදු කරනු ලබන ගොඩනැඟිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා හඳුනා ගෙන මේ වනවිට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති පරිදි පුරවැසි ප්‍රඥප්තිය පිළියෙල කර සභාවෙහි ප්‍රදර්ශනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි. | පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 මගින් හඳුන්වා දී ඇති පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 මැයි 31 දිනට පෙර සකස් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ගබඩා තොග සාරාංශයේ ඇතුලත් රු.25,593,657 ක් වටිනා ගබඩා තොග ශේෂ 11 ක භාණ්ඩ තොගයක් භෞතිකව නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවත එන මෙම ශේෂයන් සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ශේෂ අනෙකුත් උපකාර්යාල වෙත නිකුත් කරන ලද උපකරණ බවත්, මෙම ශේෂ ගබඩා සාරාංශයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ශේෂය පිළිබඳ පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දරුවන් අතර බෙදා දීම සඳහා රු.4,449,900 ක් වටිනා පිටු 120 CR පොත් 21190 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය ,1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 14, 103, 178(7)(2), 207, 208, 211, 213 හා මුදල් රෙගුලාසි 237, යන විධිවිධානයන්ගෙන් බැහැරව කටයුතු කර තිබූ අතර මේ සම්බන්ධයෙන් සාධ්‍යතා වාර්තාවක් ද සකස් කර නොතිබුණි. | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හා විධායක නිලධාරි වන සභාපතිවරයාගේ ලිඛිත උපදෙස් මත කටයුතු කර ඇති බවත්, ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොමැති බව පිළිගනු ලබන බව. | පනත, රීති හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අකුරැස්ස ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ආර්ථික දුෂ්කරතා පවතින පාසල් හා දහම් පාසල් දරුවන්ට 2023 වර්ෂය සඳහා නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පොලියෙස්ටර් රෙදි යාර 2025.5 ක් රු.800,000 ක් වැයකර රෙදිපිළි අලෙවි සැලකින් මිලදී ගැනීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ), 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 14, 207, 208, 178(7) (2) මුදල් රෙගුලාසි 136 (1) විධිවිධානයන්ගෙන් බැහැරව සිදු කර තිබුණි. තවද බෙදාහැරීමේ ක්‍රියාවලිය ඇතුළත් ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘති වාර්තාවක් සකස් කර නොමැති බවත්, නිල ඇඳුම් රෙදි බෙදාහැරීමට ප්‍රධානාචාර්යවරුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කර ඇති බව. | පනත, රීති හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 170 හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) මාර්ගෝපදේශයෙන් බැහැරව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.5,449,900 ක් වටිනා ප්‍රසම්පාදනයන් තුනක් ක්‍රියාත්මක කර තිබුණි. | ගණන් දීමේ නිලධාරියාගේ ලිඛිත උපදෙස් මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් සම්පූර්ණයෙන් ම බැහැර නොවෙමින් පූර්ණ විනිවිද භාවයෙන් යුතුව කටයුතු සිදු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |